*සැ. යු.* - (i) 2014.04.11 වැනි දින පළවූ අංක 1,858 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,859 - 2014 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 290 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 291 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 294 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 255

DIRF/RECT/277/AY(1).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් වන නීති නිළධාරින්/නිලධාරිණියන් 2012.10.25 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බලසේනාවේ කපිතන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

*2012.10.25 දින සිට කපිතන් නිලය* :

රෙෂාන් දමින්ද උඩුවිලආරච්චි
අලවලගේ දූලාංජලී සිරිවර්ධන
පැලවත්තගේ සුරන්ගිකා ප්‍රියදර්ශණී නානායක්කාර
විජේසුන්දර මුදියන්සේලාගේ ගයාන්ති දිනූෂිකා ඉද්දවෙල
බෙනරගම විදානගේ නිලූෂිකා ප්‍රියදර්ශණී
හේවා රණවීරගේ චතුර සමන්ත

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින
කොළඹ දී ය.

04-429

---

2014 අංක 256

DIRF/RECT/277/1/AY(1).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් කෘෂිකර්ම නිලධාරීන් 2012.10.25 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බලසේනාවේ කපිතන්/ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

*අ. 2012.10.25 දින සිට කපිතන් නිලය*

කාරියප්පෙරුම මුදියන්සේලාගේ රොෂාන් රණසිංහ
කදන්හේන පොල්වත්තේ ගෙදර රාජේෂ් සංඛ කුමාර ආරියසිංහ
කෝනාර මුදියන්සේලාගේ ප්‍රදීප් කුමාර පියසේන
ජයසේකර කංකානම් ආරච්චිගේ චතුරංග සඳරුවන්
විජේසිංහ රාජපක්ෂ ආරච්චිල්ලාගේ චාමර ප්‍රසන්න

*ආ. 2012.10.25 දින සිට ලුතිතන් නිලය* :

විජලත් ආරච්චිගේ වජිර ප්‍රසන්න විජලත්

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

04-428

---

2014 අංක 257

DIRF/RECT/277/AY(1).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම

පහත නම් සඳහන් තූර්‍යවාදක නිලධාරි 2012.10.25 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල සේනාවේ ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

*2012.10.25 දින සිට ලුතිතන් නිලය* :

බිංදු හේවාගේ දයාල් අංජන

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

04-430

2014 අංක 258

DIRF/RECT/277/AY(1).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් තොරතුරු තාක්ෂණ නිලධාරීන්/නිලධාරිණියන් 2012.10.25 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල සේනාවේ ලුතිතන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

*අ. 2012.10.25 දින සිට මෘදුකාංග ඉංජිනේරු ලුතිතන් නිලය*

දෙල්පාගොඩගේ අමා නයනහාරි ජයවීර
චමාල් ගාර්දි හේවාවසම්
සිංහල පේඩිගේ ඉෂාරා උදේනි දයාරත්න
බියගමගේ මනීෂ ධනුෂ්ක ප්‍රනාන්දු

*ආ. 2012.10.25 දින සිට ජාලගත ඉංජිනේරු ලුතිතන් නිලය*

ගුරුනාද හෙට්ටි ආරච්චිලාගේ සුමේධ නුවන් ජයරත්න
සේදාරි මුදියන්සේලාගේ චන්දන රසික සෙනෙවිරත්න
එළුවපිටිගේ කණිෂ්ක කුලසිංහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

04-431

---

2014 අංක 259

DIRF/RECT/268/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරිණිය 2013 අප්‍රේල් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බළ හමුදාවේ දෙවන ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබේ.

සි/57855 කාන්ත කෙඩෙට් නිලධාරි චතුරිකා ජයමාලි වන්නිපුර

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

04-426

---

2014 අංක 260

DIRF/RECT/268/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ලද අධිකාරියට පත්කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2013 අගෝස්තු මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිතන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/57858 කෙඩෙට් නිලධාරි - ලොකුකංකානම්ගේ පසිඳු දක්ෂිණ පීරිස්

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

04-427

---

# රජයේ නිවේදන

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

2002 අංක 17 දරන මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම

2002 අංක 17 දරන මැනුම් පනතේ 27(අ) වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කරමින් පිළිවෙලින් 2013.08.16 හා 2013.12.20 දිනැති අංක 1824 සහ 1842 දරන ගැසට් පත්‍රවල පළකරන ලද නිවේදන පහත සඳහන් ලෙස 2014.03.06 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරමි.

(අ) ඉඩම් මැනුම් සභාවේ නිලබලයෙන් සාමාජිකයින් වන තැනැත්තන්

| | | | |
|---|---|---|---|
| (i) | නිහාල් ගුණවර්ධන මයා<br>සර්වේයර් ජනරාල් | සභාපති | සර්වේයර් ජනරාල් ධූරයේ රැඳී සිටින කාලය දක්වා |
| (ii) | පනික් මුදියන්සෙලාගේ පාලිත උදයකාන්ත මයා<br>අතිරේක සර්වේයර් ජනරාල් | උප සභාපති | අතිරේක සර්වේයර් ජනරාල් ධූරයේ රැඳී සිටින කාලය දක්වා |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

වර්ෂ 2014 ක් වූ මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

04-483

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

5 වගන්තිය යටතේ නිවේදනය

110 වැනි අධිකාරිය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8146 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනයෙහි බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ යන ශීර්ෂයෙහි යටතේ,

ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 17 දරන විෂය වෙනුවට මෙහි "අ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තු ඇතුලත් කිරීමෙන් කළුපහන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ද,

ශීර්ෂ අංක 17 ට ඉක්බිතිව "ආ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තුව ඇතුළත් කිරීමෙන් රත්මල්ගොඩ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත් කිරීමෙන් ද 2014 අප්‍රේල් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් ප්‍රතිශෝධනය කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

**බස්නාහිර පළාත කලුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලුපහන උපත් මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් "අ" උපලේඛනය**

1. බොරලුගොඩ
2. දාච්ච කනත්ත
3. දම්මින්න
4. දීගන්වල
5. ගනේතැන්න
6. ගොන්නගෙදර වත්ත
7. ගුරුගොඩ
8. ගුරුගොඩ ගොඩැල්ල වත්ත
9. කලුගල්හේන
10. කනුමස්සාගල
11. කටුහේන
12. කන්දවත්ත
13. කීරගල
14. කිරිල්හේන
15. කොළඹයාහේන
16. කුඩු මිරිස්ස හේන
17. මානාන
18. මැදගංගොඩ
19. මීගහවත්ත
20. මිගැත්තර
21. මහ ගම්මැද්ද
22. නැදුන්මණ්ඩිය
23. ඔයබඩ හේන
24. පන්සලහේන
25. පතිරගොඩ
26. පර්ත්වත්ත කොටසක්
27. පර්ත්වත්ත කලුපහණ කොටස
28. පොල්මණ්ඩිය
29. සොඳුරුප්ප
30. වග්ගම්මැද්ද
31. වගවත්ත
32. කලුපහණ
33. පෝරුවදණ්ඩ බටහිර
34. අරුණගම
35. පර්ත්වත්ත පොල්වත්ත කොටස

**බස්නාහිර පළාත කලුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්මල්ගොඩ උපත් මරණ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් "ආ" උපලේඛනය**

1. අපිත් පොරස්ට් වත්ත
2. බොරලුගොඩ
3. ඇල්ලදොල
4. ප්‍රනාන්දු පෙදෙස
5. ගන්ගොඩ
6. ගර්ටන්වත්ත/කොස්හේන
7. ගල්ගන්හෝස්වත්ත
8. ගෝනවල
9. හෙලකුඹුර
10. හේන්යාය ශ්‍රී ධීරානන්ද මාවත
11. හොරකැටිය වත්ත
12. කත්දහේන
13. කජුවැටිය පාර
14. කැකුලලිය
15. මගුරුවිල
16. මැද මූකලාන
17. පහුරුතොට වත්ත
18. පනංගල වත්ත
19. පනංගල
20. පැලිපිටිගොඩ

21. පර්ත්වත්ත
22. පර්ත් වත්ත මාපුටුගල කොටස
23. පෝරුවදණ්ඩ නැගෙනහිර
24. රත්මල්ගම
25. රත්මල්ගොඩ
26. රත්මල්ගොඩ ජනපදය
27. බොසල් උයන ජනපදය
28. වෝටර් ලැන්ඩ් ජනපදය
29. යහල වත්ත
30. කොස්හේන

04-498

---

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වගන්තිය යටතේ නිවේදනය

110 වැනි අධිකාරිය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8146 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනයෙහි බදුල්ල දිස්ත්‍රික්කය යන ශීර්ෂයෙහි අංක 11 යටතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවින්න නැගෙනහිර උපත් මරණ කොට්ඨාසයට අදාළව නිවේදනය කර තිබූ ගම් ලැයිස්තුව වෙනුවට පහත "අ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තු ඇතුළත් කිරීමෙන් දෙහිවින්න නැගෙනහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම් කොට්ඨාසයද, ශීර්ෂ අංක 11 ට ඉක්බිතිව "ආ" උපලේඛනයේ සඳහන් ගම් ලැයිස්තුව ඇතුළත් කිරීමෙන් මාළිගාතැන්න උප්පැන්න හා මරණ කොට්ඨාසය යනුවෙන් අලුත් විෂය ඇතුළත් කිරීමෙන් ද 2014 අප්‍රේල් මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් ප්‍රතිශෝධනය කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2014 මාර්තු මස 20 දින,
කොළඹ දී ය.

### බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල රෙජිස්ට්‍රාර් කොට්ඨාසයේ දෙහිවින්න නැගෙනහිර උපත් හා මරණ කොට්ඨාසය "අ" උපලේඛනය

| | |
|---|---|
| ඇටම්පිටිය නගරය | ඇටම්පිටිය වත්ත දෙවන කොටස |
| උඩාරාව | කන්සාවත්ත |
| කොටුගොඩැල්ල | ගල්එක්කල |
| පරංචිඇල්ල නිවාස යෝජනා කොටස | පල්ලේගම |
| වේල්ලේ වෙලගම | කිරවනාබිස්ස |
| ගලබඩඇල්ල | ගුරුකදුර |
| නිලිඅතුගොඩ | නෙළුව වත්ත කින් රෝස් ඒ කොටස |
| අස්වැද්දුම් වෙල | ආලෝකන්ගම |
| ඇටැම්පිටියවත්ත 1 වන කොටස | ගාවෙලගම |
| තැඹකුඹුරගම | වේරගම |
| උඩගම | මැදගම |
| පහමුණුතොට | ඌව හයිලන්ඩ්වත්ත නව කොටස |
| එල්ක්පාර්ක් වත්ත | දවටගහඋල්පත |
| දෙහිඅන්දෝව | හින්නාරංගොල්ල |
| ඉඩමේගම | කිරින්දබැද්ද |
| ජයසිංහගම | පංජුල්ල |
| මිරහල්ගමුව | දෙහිවින්න |
| අම්පිටිගොඩ | කැටලකුඹුර |
| නෙලුව වත්ත කින් රෝස් එන් කොටස | මහවෙලගම |
| සිවිය වැල්ගොල්ල | ඩින්ස් ලැන්ඩ් ගම |
| දික්වැල්ල වත්ත ඩීන්ස් ලැන්ඩ් කොටස | නෙළු දණ්ඩ ගම |
| වැටබැද්ද | |

### බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල රෙජිස්ට්‍රාර් කොට්ඨාසයේ මාළිගාතැන්න උප්පැන්න හා මරණ කොට්ඨාසය "ආ" උපලේඛනය

| | |
|---|---|
| අඹගහ හෙලගම | |
| ගස්ගොල්ල ගම | ගෝනමල් පීල්ල ගම |
| බින්තානියා වත්ත | බ්‍රැන්ඩන්බර්ග් වත්ත |
| වටබැද්දගම | උලාන පතන |
| උඩපඹේගම | පන් වැව ගම |
| ගාලේ හෙලගම | පෙරහෙට්ටියගම |
| පුරන්පඹේගම | ඉඩමේගෙදරගම |
| රණවිරුගම | එනසල් බැද්දේගම |
| ඌව හයිලන්ඩ් වත්ත පැරණි කොටසක් | බටවලගම |
| | වැපස්සාවෙල |
| දඹගොල්ල ගම | අයිස්ලැබ් වත්ත කුරුකුදේ කොටසක් |
| බෝගහඇල්ල ගම | පල්ලෙවෙල |
| අම්බන්තැන්න | සපුකණුව |
| කුරුකුදේගම | කහටගොල්ල |
| වැතලාව | නෙළුගොල්ල |
| හුරිඇල්ල | අයිස්ලැබ් වත්ත මල්වත්ත කොටස |
| කුඩුමහුවෙල | පිටකදුර |
| මහ කුඹුර | හෙලකටුගහ |
| කොණ්ඩගොල්ල | වෙල්සි වත්ත පැරණි කොටස |
| මහතැන්න | පහල කටුගහ |
| එනසල්බැද්ද | අයිස්ලැබ් වත්ත |
| නෙලුව වත්ත පැරණි කොටස | වරකාදණ්ඩ |
| කොටසක් | ඇල්ලෙවෙල ගම |
| මැනික් ඇල්ල | ගෝනතිබ්බොටුගොල්ල ගම |
| අගුරු බැද්ද | පන්වැව ගම |
| අයිස්ලැබ් වත්ත කොටස කොටසක් | අඹේවෙල |
| දිබ්බැද්ද | නෙළුව වත්ත නෙළුව කොටස |
| ඇත්තල ගෙදර | ශාන්ත ජේම්ස් වත්ත ඉහළ කොටස |
| දිය උන්නාව ඇල්ල | |
| මාලිගාතැන්න | |
| නෙළුව | |
| මහතැන්න | |
| ශාන්ත ජේම්ස් වත් පහළ කොටස | |

04-499

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1334397

සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමටඩ්

2014 පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2010 ජනවාරි මස 22වැනි දින සහතික කරන ලද අංක 11200 සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ප්‍රනාන්දුපුල්ලේ විසින් 2011 ජනවාරි මස 07 වැනි දින සහතික කරන ලද අංක 15195, 2012 දෙසැම්බර් මස 13 වැනි දින සහතික කරන ලද අංක 17970 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බිංගිරිය වැල්ලරාව හි ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ජයලත් ජේඩිගේ සෝමපාල හෙවත් ජයතිලක ජේඩිගේ සෝමපාල උසක්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2010 ජනවාරි මස 22 වැනි දින සහතික කරන ලද අංක 11201 මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ප්‍රනාන්දුපුල්ලේ විසින් 2011 ජනවාරි මස 07 වැනි දින සහතික කරන ලද අංක 15197, සහ 2012 දෙසැම්බර් මස 13 වැනි දින සහතික කරන ලද අංක 17968 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බිංගිරිය වැල්ලරාව හි ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ චක්‍රවර්තීගේ තනුජා මල්මාලි ප්‍රනාන්දු උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි අසූහත්ලක්ෂය (රු. 18,700,000) ක මුදලක් 2013 සැප්තැම්බර් මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි අසූහත්ලක්ෂයක (රු. 18,700,000) ක මුදල අයකර ගැනීම සඳහා 2013 සැප්තැම්බර් මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා 22% වැඩිපුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ (යම් ගෙවීම් වෙතොත්) ඒවා ද අඩුකොට එකී අංක 11200, 15195, 17970, 11201, 15197 සහ 17968 දරන බැඳුම්කරයක් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි පළවන සහ දෙවන වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩ්‍රොප් වීදියේ අංක 182 හි 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, යාගම්පත්තු කෝරළේ, කටුගම්පල හත්පත්තුවේ, කළුගම ගමේ පිහිටි කළුගම වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. එච්. ජේ. අමරදීප විසින් 2010 සැප්තැම්බර් මස 22 වැනි දින සාදන ලද අංක 433/2009 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පිඹුරු අංක 722 හි ලොට් 1, 2, 3 සහ 4 ද, නැගෙනහිරට : අනුර දිසානායකට අයත් ඉඩම ද, දකුණට : බලයලත් මිනින්දෝරු එල්. එච්. ජේ. අමරදීප සාදන ලද පිඹුරු අංක 302/2009 හි ලොට් 1 සහ 2 ද සහ බස්නාහිරට : වැල්ලරාව - තල්ගහපිටිය (පීඑස්) පාරෙන් ද, මායිම් වූ අක්කර තුනයි, රූඩ් තුනයි, පර්චස් අටයි දශම පහ (අ. 3, රූ. 3, පර්. 8.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්‍රිරු ආර් 104/82 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ අංක 1476 දරන ඉහළ කළුගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ යාගම්පත්තු කෝරළේ කටුගම්පල හත්පත්තුවේ ගිණිදම්මන සහ පහළ කළුගමුව කිනියම් කෝරළේ තල්ගහපිටිය ගමේ පිහිටි තල්ගහපිටිය වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් 2004 දෙසැම්බර් මස 05 වැනි දින සාදන ලද අංක 6877 දරන පිඹුරේ ලොට් 414 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : එම පිඹුරේම ලොට් 413 ද, නැගෙනහිරට : කළුගමුව සිට ප්‍රධාන පාරට ඇති (පීඑස්) පාර ද, දකුණට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 415 ද සහ බස්නාහිරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 412න් මායිම් වූ පර්චස් විසිහයයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 26.70) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු එම් 162/184 සහ ආර් 101/200 යටතේ ලියාපදිංචි කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ යාගම්පත්තු කෝරළේ කටුගම්පල හත්පත්තුවේ ගිණිදම්මන සහ පහළ කළුගමුව කිනියම් කෝරළේ තල්ගහපිටිය ගමේ පිහිටි තල්ගහපිටිය වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් 2004 දෙසැම්බර් මස 05 වැනි දින සාදන ලද අංක 6877 දරන පිඹුරේ ලොට් 415 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 414 ද නැගෙනහිරට : කළුගමුව සිට ප්‍රධාන පාරට ඇති (පීඑස්) පාර ද, දකුණට : පිඹුරු අක 6878 හි ලොට් 1 ද සහ බස්නාහිරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 412න් මායිම් වූ පර්චස් විසිහයයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 26.70) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු එම් 162/185 සහ ආර් 101/200 ඒ යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ අංක 1476 දරන ඉහළ කළුගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

04-543

---

මහජන බැංකුව - පානදුර නගර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29ඩී) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.05.31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. කේ. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2011.04.11 දිනැති අංක 4497 දරන උකස්කරය සහ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ද සිල්වා විසින් සහතික කරන ලද 2008.01.10 දිනැති අංක 2209 දරන බැඳුම්කරය හා කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. කේ. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2010.05.14 දිනැති අංක 3369 දරන බැඳුම්කරය සී. ස. ලක්මාල් ගාමන්ට්ස් සහ වොෂින් පුද්. සමා. යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 4497 දරන උකස්කරය යටතේ දැනට රුපියල් මිලියන දෙකයි හාරසිය පනස් අටදහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතරක් (රු.2,458,333.34) යන අංක 2209 දරන බැඳුම්කරය මත රුපියල් මිලියන දෙකයි තුන්සිය දහසක් ද (රු. 2,300,000) අංක 3369 දරන බැඳුම්කරය මත රුපියල් මිලියන හතරයි හයසිය හතලිස් අටදහස් තුන්සිය හතලිස් හතරයි ශත අසූ හතරක් ද (රු. 4,648,344.84) මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද ඉහත කී රුපියල් මිලියන දෙකයි හාරසිය පනස් අට දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් හතර (රු. 2,458,333.34) ක මුදල මත වර්ෂයකට 15% බැගින් 2011.07.04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පොලිය ද ඉහත කී මිලියන දෙකයි තුන්සිය දහස (රු.2,300,000) ක මුදල මත වර්ෂයක 26% බැගින් 2011.07.05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පොලිය ද ඉහත කී රුපියල් මිලියන හතරයි හතලිස් අට දහස් තුන්සිය හතලිස් හතරයි ශත අසූ හතර (රු.4,648,344.84) ක මුදල මත වර්ෂයකට 16% බැගින් 2011.07.08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා තවදුරටත් පොලිය ද සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී මුදල් අය කර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 4,497,2209 සහ 3369 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස් කරන ලද දේපලවල විස්තරය

*උපලේඛනය*

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F612/65 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ, තල්පිටිදෙබැද්දේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුල මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට අවසර ලත් මානක එස්. වික්‍රමසිංහ මහතා විසින් වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 නමැති ඉඩමට එකී අංක 4531 ප්‍රකාර මායිම් උතුරට : දේවාවිල පාර ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට: ලොට් 2 ද සහ බස්නාහිරට : එන් දර්ශන පෙරේරා අයිතිවාසිකම් කියන ඉඩම ද යන මායිම් තුල පිහිටි පර්චස් තිස්පහ (අක්. 0, රූ. 0. පර්. 35) ක් විශාල ඉඩම වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 613/67 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී මහවිල පිහිටි ඇහැටුගහවත්ත නැමැති ඉඩමට වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 නමැති ඉඩමට එකී 4531 පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට : මිරිස්වත්ත පාර (කොටස) ද සහ බස්නාහිරට එන් දර්ශන පෙරේරා අයිතිවාසිකම් කියන ඉඩම ද යන මායිම් තුල පිහිටි පර්චස් තිස්පහක් (අක්. 0, රූ. 0, පර්. 35) ක් විශාල ඉඩම වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F613/67 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 නැමැති ඉඩමට එකී 4531 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ලොට් 4 ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : මිරිස්වත්ත පාර (කොටස) ද සහ බස්නාහිරට : ලොට් 8 ද යන මායිම් තුල පිහිටි පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 13.50) විශාල ඉඩම වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 613/68 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩම වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 නමැති ඉඩමට එකී 4531 දරන පිඹුර ප්‍රකාර උතුරට : දේවවිල පාර ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 7 සහ 3 ද සහ බස්නාහිරට : ලොට් 8 ද යන මායිම් තුල පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) ක් විශාල ඉඩම වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F613/69 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 5 නමැති ඉඩමට එකී 4531 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : දේවවිල පාර සහ අංක 2298 පිඹුරේ දැක්වෙන ලොට් 4 ද, නැගෙනහිරට : කින්දෙකැටිය කුඹුර නමැති ඉඩම සහ ඇත්ගාලේ වලේගොඩ කට්ටිය කුඹුර සහ ලොට් 6 ද, දකුණට : ලොට් 6 ද සහ බස්නාහිරට : ලොට් 3 සහ 4 ද යන මායිම් තුල පිහිටි රූඩ් දෙකයි පර්චස් පහලොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 15.50) විශාල ඉඩම වේ.

පානදුර ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 613/70 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 6 නමැති ඉඩමට එකී 4531 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ලොට් 5 ද, නැගෙනහිරට : කින්දෙකැටිය කුඹුර නමැති ඉඩම සහ ඇත්ගාලවලේ ගොඩකට්ටිය කුඹුර නමැති ඉඩම ද, දකුණට: ඇත්ගාලවලේ ගොඩකට්ටිය ද සහ ජී. කේ. ජී. පෙරේරා අයිතිවාසිකම් කියන ඉඩමද සහ බස්නාහිරට : ලොට් 7 සහ 5 ද යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් තිහක් (අ. 0, රූ. 1, පර්. 30) විශාල ඉඩම වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 613/71 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531 13000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 7 නමැති ඉඩමට එකී 4531 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ලොට් 4 ද, නැගෙනහිරට : ලොට් 5 සහ 6 ද, දකුණට : මිරිස්වත්ත පාර (කොටස) සහ බස්නාහිරට : ලොට් 3 ද යන මායිම් තුල පිහිටි පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) විශාල වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 613/72 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත මහවිල පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට වර්ෂ 2007.03.10 වැනි දින මැන සාදන ලද අංක 4531/9000 දරන පිඹුරේ දැක්වෙන ලොට් 8 නමැති ඉඩමට එකී 4531 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : දේවවිල පාර ද, නැගෙනහිරට : ලොට් 4 සහ 3 ද, දකුණට: මිරිස්වත්ත පාර ද සහ බස්නාහිරට : ලොට් 2 සහ 1 ද මායිම් තුල පිහිටි පර්චස් එකොලහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0. පර්. 11.50) ක් විශාල ඉඩම් වේ.

ඉහත සඳහන් ඉඩම් පහත සඳහන් ඉඩමෙන් නැවත මැන බෙදන ලද ඒවා වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 497/58 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුල, තල්පිටිදෙබැද්දේ, මහවිල උපකාර්යාල සීමාව තුල පිහිටි ඇහැටුගහවත්ත නැමති ඉඩමට (අවසරලත් - එම්. කේ. ඩී. එස්. ගුණතිලක මහතා විසින් 1964.04.05 වැනි දින මැන සාදන ලද අංක 3434 දරන පිඹුරේ ප්‍රකාර ලොට් 5 ඒ සිට 5 ඩී දක්වා ඒකාබද්ධ කොට නැවත බෙදා වෙන් කරන ලද) අවසර ලත් මානක වයි. කරුණාරත්න කොස්තා මහතා විසින් 1987.11.28 වැනි දින මැන සාදන ලද අංක 756 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : පාර සහ අංක 2298 දරන පිඹුරේ ලොට් 4 ද, නැගෙනහිරට : කින්දෙකට්ටිය කුඹුර සහ ඇත්ගාලවලේගොඩකට්ටිය කුඹුර ද, දකුණට : ඇත්ගාලෙවෙලේගොඩ කට්ටිය ද, ඒ. කේ. ජී. පෙරේරාට අයත් මිරිස්වත්ත ද, සහ මිරිස්වත්ත මාවත ද සහ බස්නාහිරට : දැනට එම්. මාර්ටින් පෙරේරාට අයත් අංක 2298 දරන පිඹුරේ ලොට් 6 ද යන මායිම් තුල පිහිටි අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දාහතක් (අ. 1, රූ. 2, පර්. 17) ක් විශාල රූඩ් තුනයි පර්චස් දාහතක් (අ. 1, රූ. 3, පර්. 17) ක් විශාල වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකාර (කළුතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාලුපාර,
පානදුර.

04-584

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.